# වර්තමාන ශ්‍රී ලංකා පක්ෂ ක්‍රමයේ හැඩ ගැසීම්

## එච්. රංජිත්

වර්තමානයෙහි ශ්‍රී ලංකාවේ පක්ෂ ක්‍රමය දෙස අවධානය යොමු කරන්නෙකුට, එය නව හැඩගැසීම් ගණනාවකින් සමන්විත වී ඇති ආකාරය පැහැදිලි වේ. මෙම නව හැඩ ගැසීම් හෙවත් ප්‍රවණතා අතුරින් ඇතැම් ප්‍රවණතාවන් 1977 ට පෙර කාලයේ මෙරට පක්ෂ ක්‍රමය තුළ දෘෂ්‍යමාන ව පැවති අතර, 1977 න් පසුව එම ප්‍රවණතා පක්ෂ ක්‍රමය තුළ පැලපදියම් වී ඇති බව පෙනේ. මෙහිදී 1977 වර්ෂය කඩ ඉමක් ලෙස යොදා ගනු ලැබුයේ, එම වර්ෂය මෙරට ආර්ථික, දේශපාලන හා සමාජ ක්ෂේත්‍රයේ විපරිවර්තනයක් සනිටුහන් කළ වසරක් වූ බැවිනි. 1977න් පසු, මෙරට ඇති වූ සමාජ ආර්ථික සහ දේශපාලන විපරිවර්තනය මෙරට පක්ෂ ක්‍රමයේ නව පෙළ ගැසීම් වලට ද සෘජුව හෝ වක්‍රව බලපා ඇති ආකාරය එම ප්‍රවණතා විමසා බැලීමෙන් පැහැදිලි වේ. එලෙස පක්ෂ ක්‍රමයේ නව හැඩ ගැසීම් සඳහා බලපෑ සමාජ ආර්ථික සහ දේශපාලන සාධක අතර 1977 න් පසුව කෙමෙන් උග්‍රවූ ජන වාර්ගික අර්බුදය, 1977 එ.ජා.ප. රජය හඳුන්වාදුන් විවෘත ආර්ථික ප්‍රතිපත්තිය, 1978 දෙවන ජනරජ ව්‍යවස්ථාව මගින් ඇතිකළ විධායක ජනාධිපති ක්‍රමය, එම ව්‍යවස්ථාව මගින් හඳුන්වාදුන් සමානුපාතික නියෝජන ක්‍රමයේ ක්‍රියාකාරිත්වය ප්‍රමුඛත්වයෙහිලා සැලකිය හැකිය.

ඉහත දක් වූ කරුණු මෙරට පක්ෂ ක්‍රමයේ නව හැඩ ගැසීම් වලට කෙලෙස බලපා ඇත්තේද යන්න, මේ පිළිබඳව ගැඹුරින් සලකා බැලීමෙන් වටහා ගත හැක. බහු පක්ෂ ක්‍රමය තුළ ද්වි සභාග පක්ෂ ක්‍රමය හැඩ ගැසීම, තුන්වන බලවේගයන් නිශේධාත්මක ස්වභාවයක් ගැනීම, ස්වාධීන අපේක්ෂකයන්ගේ නියෝජනය හීන වී යාම හා

ස්වාධීන කණ්ඩායම්වල වර්ධනය, වාමාංශික පක්ෂ වල පසුබෑම, ප්‍රධාන පක්ෂවලින් කැඩී වෙනම පක්ෂ පිහිටුවා ගැනීම හා එම පක්ෂ නායකයින් නැවත තම මව් පක්ෂ කරා පුනරාගමනය වීම, ප්‍රධාන පක්ෂවලින් කැඩී ගිය පක්ෂ නැවත නැවතත් පිල් වශයෙන් බෙදීයාම, උතුරේ සහ දකුණේ ප්‍රචණ්ඩත්වය මත පදනම් වූ සන්නද්ධ පක්ෂ ඇතිවීම, වාර්ගික පක්ෂවල සංඛ්‍යාත්මක වර්ධනය, සෑම පක්ෂයකම අඩු වැඩි වශයෙන් පක්ෂ නායකත්වයේ ආධිපතිත්ව බලය වර්ධනය වීම, ප්‍රධාන පක්ෂ දෙක අතර ආර්ථිකමය ප්‍රතිපත්ති අතින් පොදු එකඟතාවයක් පිළිඹිබු කිරීම, ආදී වශයෙන් දැක ගත හැකිය.

## 1 බහු පක්ෂ ක්‍රමය තුළ ද්විපක්ෂ ක්‍රමයක හැඩ ගැසීම

1977 න් පසුව, ඊට පෙර පැවති පක්ෂ සංඛ්‍යාවට වඩා විශාල පක්ෂ සංඛ්‍යාවක් මෙරට පක්ෂ ක්‍රමය තුළ බිහි වූ බව එම සංඛ්‍යා විමසා බැලීමෙන් දැනගත හැකිය. මෙමගින් 1977 ට පෙර බහු පක්ෂ ක්‍රමයක් මෙරට පක්ෂ ක්‍රමය තුළ නොතිබුණා යයි අවධාරණය නොවේ.

1977 න් පසු සිදුවූයේ එතෙක් පැවති බහු පක්ෂ ක්‍රමය තවදුරටත් තහවුරු වී, මින් පෙර නොවූ විරූ අයුරින් දේශපාලන පක්ෂ මැතිවරණ ප්‍රවාහයට එකතු වීමයි. ඒ බව 1977 ට පෙර පැවති පක්ෂ සංඛ්‍යාවන් ඊට පසු පැවති පක්ෂ සංඛ්‍යාවන් සමඟ සැසඳීමෙන් අවබෝධ කර ගත හැකිය.

**1977 ට පෙර සහ පසු පැවති පක්ෂ සංඛ්‍යාව**

| | වර්ෂය | ජා.මැ.පි.දෙ.ප. |
|---|---|---|
| පාර්ලිමේන්තු මැතිවරණය | 1965 | 09 |
| පාර්ලිමේන්තු මැතිවරණය | 1970 | 09 |
| පළාත් සභා මැතිවරණය (උ.නැ. හැර) | 1988 | 18 |

| | | | |
|---|---|---|---|
| පළාත් සභා මැතිවරණය (උ.නැගෙනහිර) | | 1988 | 23 |
| පාර්ලිමේන්තු මැතිවරණය | | 1989 | 23 |
| පාර්ලිමේන්තු මැතිවරණය | | 1994 | 21 |
| මූලාශ්‍ර- | මැතිවරණ කොමිෂන් වාර්තා | | |

මෙලෙසින් මෙරට හතු පිපෙන්නාක් මෙන් පක්ෂ ඇතිවීමට ප්‍රධාන හේතුව වශයෙන් ලාංකික සමාජය බහුවිධ සමාජයක් වීම සැලකිය හැක. එනම්, සිංහල, ද්‍රවිඩ, මුස්ලිම්, බර්ගර් යනාදී වාර්ගික වශයෙනුත්, බෞද්ධ, හින්දු, ඉස්ලාම්, ක්‍රිස්තියානි යනාදී ආගමික වශයෙනුත්, මෙම බහුවිධතාව පිළිඹිබු වීමය. මෙම තත්ත්වය මත පන්ති මතවාදයන්ට වඩා වාර්ගික, ආගමික මතවාදයන් මත මෙරට පක්ෂ රාශියක් පැන නැගී ඇත.

තවත් සාධකයක් වශයෙන් දේශපාලන මතවාදයන්ගේ පවතින වෙනස්කම් සැලකිය හැක. එනම්, ආර්ථික, දේශපාලන, සමාජ සහ සංස්කෘතික වශයෙන් මෙරට ජනයා තුළ පවතින අදහස් හා මතභේදයන් වේ. ආණ්ඩු බලය ලබා ගැනීම සම්බන්ධව හා එය පවත්වා ගෙන යාම සම්බන්ධයෙන් වාමාංශික පක්ෂ වල පවත්නා වූ න්‍යායාත්මක මතභේදයන් බොහෝ දුරට එම පක්ෂ වල දෙදරීම් වලටත්, එමඟින් නව පක්ෂ බිහිවීමටත් හේතු වී ඇත.

1978 දෙවන ජනරජ ව්‍යවස්ථාව මඟින් ඇති කළ සමානුපාතික නියෝජන ක්‍රමය ද මෙම පක්ෂ සංඛ්‍යාව වර්ධනය කිරීමට හේතු වී ඇත. මෙම නියෝජන ක්‍රමය මඟින් කුඩා පක්ෂවලට වුවද, ජනතාවගෙන් ඔවුනට ලැබෙන ඡන්ද ප්‍රමාණයට අනුව නියෝජනයක් ලබා ගැනීමට හැකියාවක් ඇත.

තව ද පක්ෂ සංඛ්‍යාව කෙරෙහි පළාත් සභා ක්‍රමය හා පළාත් පාලන ක්‍රමය බලපා ඇත. මේ යටතේ ජාතික මට්ටමෙන් පාලන බලය ලබා ගැනීම සඳහා තරඟ කිරීමට හැකියාවක් හෝ සුදුසු කමක් නැති,

එහෙත් ප්‍රාදේශීය විශයෙන් බලය ලබා ගැනීමට ක්‍රියා කළ හැකි පක්ෂ කෙරෙහි පළාත් සභා ක්‍රමය හා පළාත් පාලන ක්‍රමය (මහ නගරසභා, නගරසභා, සහ ප්‍රාදේශීය සභා මැතිවරණ) මගින් පිටුබලය ලැබෙන බවට විශ්වාසයක් පවතී. නිදසුන් ලෙස ඊ.පී.ආර්.එල්.එෆ් පක්ෂය උතුරු නැගෙනහිර පළාත් සභාවට ඉදිරිපත් වී බලය ලබා ගත් අයුරු පෙන්වා දිය හැකිය.

ඉහත හේතූන් මත සැකසුණු මෙරට බහුපක්ෂ ක්‍රමය තුළ කිසිම පක්ෂයකට තනිව තරග කිරීමෙන් බහුතර ආසන සංඛ්‍යාවක් දිනාගත නොහැකි වී ඇත. එයට හේතුව සමානුපාතික නියෝජන ක්‍රමය මගින් එයට ඉඩක් නොමැති වීමයි. මෙහි සෘජු ප්‍රතිඵලය වන්නේ ඕනෑම ප්‍රධාන පක්ෂයකට ආණ්ඩු බලය ලබා ගැනීමට නම් මැතිවරණයකට පෙර අනිවාර්යයෙන්ම සභාග ගත වීමට සිදුවීමයි. එපමණක් ද නොව මැතිවරණයකට පසු ද පාර්ලිමේන්තුව තුළ තම බලය ස්ථාවර කර ගැනීමට නම් අනිවාර්යයෙන්ම සභාග ගත විය යුතුව ඇත.

මෙසේ මැතිවරණයකට පෙර සහ පසුව විවිධ පක්ෂ සභාග ගත වී සිටින්නේ මෙරට ප්‍රධාන දේශපාලන පක්ෂ දෙකක් වටාය. එනම්, එක්සත් ජාතික පක්ෂය (එ.ජා.ප) සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (ශ්‍රී.ල.නි.ප.) වටාය. නිදසුන් ලෙස පහත සඳහන් දෑ පෙන්වා දිය හැකිය.

1989 පෙබරවාරි මාසයේ දී පැවැති වූ මහා මැතිවරණයේ දී එක්සත් ජාතික පක්ෂය (එ.ජා.ප.) තොන්ඩමන් මහතාගේ ලංකා වතු කම්කරු සංගමය සමග සභාග ගත වූ අතර, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (ශ්‍රී.ල.නි.ප.) ලිබරල් පක්ෂය, මහජන එක්සත් පෙරමුණ (ම.එ.පෙ.) හා එක්සත් ලංකා ජනතා පක්ෂය (එ.ල.ජ. ප) සමග සභාග ගත වීමට සිටියද, මහ මැතිවරණයේදී පක්ෂ ලකුණ මත

ම.එ.පෙ. හා එ.ල.ජ.ප. ය ඉන් ඉවත් විය. නමුත් ලිබරල් පක්‍ෂය (ශ්‍රී ල.නි.ප) සමඟ සහාග ගත වී මැතිවරණයට ඉදිරිපත් විය. එහිදී එ.ජා.ප.ය. ප්‍රමුඛ සභාගය ජාතික ලැයිස්තුවෙන් ලද මන්ත්‍රීවරු 15 දෙනා ඇතුළුව පාර්ලිමේන්තුවේ ආසන 125 ක් ලබා රාජ්‍ය බලය ලබා ගත්තේය.

1988 පැවති ජනාධිපතිවරණයේ දී එ ජා. ප., ල. ව. ක. සංගමය හා මුස්ලම් කොංග්‍රසය සමඟ සහාග ගත විය. එම මැතිවරණයේ දී 50.43% ක ඡන්ද ප්‍රතිශතයක් ලබා ආර්. ප්‍රේමදාස මහතා ජනාධිපති ධුරයට පත්විය.

1994 අගෝස්තු මාසයේ දී පැවැත්වූ මහා මැතිවරණයේ දී ශ්‍රී. ල. නි. පක්‍ෂය, ලංකා සමසමාජ පක්‍ෂය, ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්‍ෂය, ශ්‍රී ලංකා මහජන පක්‍ෂය (වයි.පි. පිල), ප්‍රජාතන්ත්‍රවාදී එක්සත් පෙරමුණ (ලලිත් පිල), සහ දේශ විමුක්ති ජනතා පක්‍ෂය සමඟ සහාග ගතවී, පොදුජන එක්සත් පෙරමුණ නමින් තරග වැදුණි. එසේම එ.ජා. පක්‍ෂය, ලංකා කම්කරු සංගමය, ප්‍රජාතන්ත්‍රවාදී එක්සත් ජාතික පෙරමුණ (ගාමිණී පිල), සහ ශ්‍රී ලංකා මහජන පක්‍ෂය (ඔසී පිල) සමඟ සහාග ගත වී මැතිවරණයට ඉදිරිපත් විය. එහිදී පොදුජන එක්සත් පෙරමුණ ආසන 105 ක් ලබා ගත්තේය. අනතුරුව පාර්ලිමේන්තුවේ තම බලය තහවුරු කර ගැනීමට පොදුජන එක්සත් පෙරමුණ, මුස්ලිම් කොංග්‍රසය හා ස්වාධීන තුවරඑළිය කණ්ඩායම සමඟ එකතු වී රජයක් පිහිට වූයේ ය.

නැවත 1994 නොවැම්බර් මස පැවැත්වූ ජනපතිවරණයේ දි පොදුජන එක්සත් පෙරමුණ සමඟ ලංකා වතු කම්කරු සංගමයද, සහාග ගතවූ අතර, පොදුජන එක්සත් පෙරමුණේ ජනාධිපති අපේක්ෂිකාව වූ චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිණිය 62.28% ඉහළ ඡන්ද ප්‍රතිශතයක් ලබා

ජනාධිපතිනිය බවට පත්වූවාය. එසේම එක්සත් ජාතික පක්ෂය, ප්‍ර.ඒ.ජ. පෙරමුණ (ලලිත් පිල) සහ ශ්‍රී ලංකා මහජන පක්ෂය (ඔසී පිල) සමග සභාග ගතව මැතිවරණයට ඉදිරිපත් විය.

ඉහත සදහන් කළ මැතිවරණ අවස්ථාවල දී මෙරට ප්‍රධාන පක්ෂ දෙක වටා අනෙකුත් කුඩා පක්ෂ ඒකරාශී වී, මාරුවෙන් මාරුවට ආණ්ඩු බලය ලබා ගත් අයුරු දෙස අවධානය යොමු කිරීමෙන් පෙනී යන්නේ වර්තමානයෙහි මෙරට බහු පක්ෂ ක්‍රමය තුළ ද්විසභාග පක්ෂ ක්‍රමයක් තහවුරු වී ඇති බවයි. මෙම පෙළගැස්ම ඉදිරියටත් මෙලෙසම පවතී යැයි පැවසීම නිවැරදි යැයි සිතමි. එයට හේතුව කුඩා පක්ෂවලට ප්‍රධාන පක්ෂ දෙක හැර දේශපාලන පක්ෂ ක්‍රමය තුළ පැවැත්මක් නොමැති වීමයි. මෙය නිදසුන් මගින් පෙන්වා දිය හැකිය. එනම්, ලංකා සමසමාජ පක්ෂය තනි පක්ෂයක් ලෙස 1977 මහා මැතිවරණයට අපේක්ෂකයන් 82 දෙනෙකු ඉදිරිපත් කළ ද, ඉන් කිසිවෙකුට පාර්ලිමේන්තුව තුළ ආසනයක් දිනා ගත නොහැකි විය. එම මැතිවරණයේදී ම ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය තනි පක්ෂයක් ලෙස අපේක්ෂකයන් 25 දෙනෙකු මැතිවරණයට ඉදිරිපත් කළ අතර, එහිදී ද කිසිම අපේක්ෂකයෙකුට පාර්ලිමේන්තුව තුළ නියෝජනයක් ලබා ගත නොහැකි විය. නමුත් 1994 මහා මැතිවරණයේදී ල.ස.ස. පක්ෂයේ හා කොමියුනිස්ට් පක්ෂයේ සාමාජිකයින් 06 දෙනෙකුට පාර්ලිමේන්තුව තුළ නියෝජනයක් ලබා ගත හැකි වූයේ ශ්‍රී ල.නි.ප. ය සමග පොදුජන එක්සත් පෙරමුණ නමින් සභාග ගත වී මැතිවරණයට ඉදිරිපත් වූ හෙයිනි.

මහජන එක්සත් පෙරමුණ 1994 දී තනි පක්ෂයක් ලෙස මැතිවරණයට ඉදිරිපත් විය. එහිදී සිදුවූයේ 1989 මහ මැතිවරණයේ දී හිමි කරගත් ආසන දෙක ද ඔවුනට අහිමි වීමයි.

ඉහත සඳහන් නිදසුන් මගින් පෙනී යන්නේ කුඩා පක්ෂවලට පාර්ලිමේන්තුව තුළ තම පැවැත්ම ආරක්ෂා කර ගැනීමට නම් අනිවාර්යයෙන්ම ප්‍රධාන පක්ෂයක් සමඟ සහාග ගත වීමට සිදුවන බවයි.

පෙර සඳහන් කළ බහු පක්ෂ ක්‍රමය තුළ ද්විසහාග ක්‍රමයක හැඩ ගැසීම 1977 න් පසුව මෙරට පක්ෂ ක්‍රමය තුළ අමුතුවෙන් ඇති වූ දෙයක් යයි පැවසීම නිවැරදි නොවේ. එයට හේතුව 1977 ට පෙර ද මෙම බහු පක්ෂ ක්‍රමය තුළ ද්විසහාග පෙළගැස්ම පැවතුණු බැවිනි. නමුත් 1977 න් පසුව මෙරට මැතිවරණ ක්ෂේත්‍රයේ ඇතිකළ වෙනස්කම් හේතුවෙන් එම පෙළ ගැස්ම තවදුරටත් ශක්තිමත් වී ස්ථාවර වූ බව පැවසීම වඩාත් නිවැරදි වේ.

## 2 පක්ෂ ක්‍රමය තුළ තුන්වන බලවේගයක් නොපැවතීම

1977 න් පසු වත්මන් පක්ෂ ක්‍රමය තුළ පවත්නා නව පෙළගැසීමක් ලෙස පෙන්වා දිය හැක්කේ තුන්වන බලවේගයක් නොපැවතීමයි. එනම් ප්‍රධාන පක්ෂ වලින් බිඳී හා වෙනත් පක්ෂ ලෙස ඉදිරියට ආ පක්ෂ, තුන්වන බලවේගයක් ලෙස පක්ෂ ක්‍රමය තුළ පැලපදියම් වීමට උත්සාහ ගත්තද, ඒවා ප්‍රධාන පක්ෂ දෙක හමුවේ දියවී යන ආකාරයයි. 1988 දී වාමාංශික පක්ෂ එකතුව සකස් වූ එක්සත් සමාජවාදී පෙරමුණ තුන්වන බලවේගයක් ලෙස ඉදිරියට පැමිණියේය. නමුත් නොබෝ කලකින් එම පෙරමුණ තුළ මතවාදී ගැටුම් මෙන්ම, නායකත්වය මත පදනම් වූ අරගල නිසා එයද බිඳ වැටුණේය. අවසානයේදී සිදුවූයේ එම පෙරමුණේ පක්ෂ නැවත ප්‍රධාන පක්ෂ දෙක කරා රාශිගත වීමයි.

1991 දී හිටපු ජනාධිපති ආර්. ප්‍රේමදාස මහතාට එරෙහිව ඉදිරිපත් වූ දෝෂාභියෝගයත් සමඟ, මෙරට

දේශපාලන කරළියට එක් වූ ප්‍රජාතන්ත්‍රවාදී එක්සත් ජාතික පෙරමුණද, තුන්වන බලවේගයක් ලෙස ඉස්මතු වෙමින් පැවතුණි. නමුත් 1993 මැයි 01 වනදා, ආමර් වීදියේ සිදුවූ ප්‍රේමදාස ඝාතනයත් සමඟ එම පක්ෂයේ මූලික වූත්, ප්‍රධාන වූත් සටන් පාඨය ඉන් ගිලිහී ගියේය. එනම් එම පක්ෂය ඒක පුද්ගල ප්‍රේමදාස වාදයට හා රංගනයට එරෙහිව පැන නැගුනක් බැවිනි. එසේම ප්‍ර.එ.ජා. පෙරමුණේ

බහුතරයක් සාම්ප්‍රදායික එ.ජා. පක්ෂයට කිසිදා විරුද්ධ නොවීය. අවසානයේ දී සිදුවූයේ ප්‍ර.එ.ජා. පෙරමුණේ එක් කණ්ඩායමක් ගාමිණී පිල ලෙස එ.ජා. පක්ෂය වෙත පුනරාගමනය වීමත් අනෙක් කණ්ඩායම ලලිත් පිල ලෙස පොදු ජන එක්සත් පෙරමුණට එකතු වීමත්ය. නැවත මෙම පිල් දෙකම එකතු වුවත්, තුන් වන බලවේගයක් ලෙස පක්ෂ ක්‍රමය තුළ බලය තහවුරු කර ගැනීමට හැක්වේ යැයි සිතිය නොහැකිය. එයට හේතුව ප්‍ර.එ.ජා. පෙරමුණේ සම්භවය සඳහා බලපෑ ප්‍රධාන මූලය සිදී යෑමයි. තව ද එම පක්ෂයේ නිර්මාතෘ වූ ලලිත් ඇතුලත්මුදලි මහතා ගේ ඝාතනය හේතු කොට ශක්තිමත් නායකත්වයක් නොමැති වීම ද එම පක්ෂයේ පදූ බැමට හේතු වී ඇත. මෙම තත්ත්වය යටතේ ලලිත් පිලට (ප්‍ර.එ.ජා.පෙ.) සිදුවන්නේ එක්කෝ තම මව් පක්ෂය වන එ.ජා.ප. ය වෙත පුනරාගමනය වීමයි. නැතහොත් පොදු පෙරමුණ රජය සමඟ එකට එකතු වීමයි. මේ වන විටත් ප්‍ර.එ.ජා. පෙරමුණේ ගාමිණී පිල ස්වකීය මව් පක්ෂය සමඟ එක් වී සිටින අතර ශ්‍රීමතී පිල ද ඉදිරියේදී එ.ජා.පයට එකතු වීමට ඉඩ ඇත.

## 3 පාර්ලිමේන්තුව තුළ ස්වාධීන අපේක්ෂකයින්ගේ නියෝජනය හීන වී යෑම හා ස්වාධීන කණ්ඩායම්වල වර්ධනය

1977 වන විට පාර්ලිමේන්තුව තුළ, ඉන් පෙර නොවූ විරූ අයුරින් ස්වාධීන අපේක්ෂකයන්ගේ නියෝජනය පහත වැටුණි.

මැතිවරණ වලට ඉදිරිපත් වූ හා ඉන් ජයගත් ස්වාධීන අපේක්ෂකයන්ගේ සංඛ්‍යාව

| වර්ෂය | ස්වාධීන අපේක්ෂක සංඛ්‍යාව | ජයගත් ආසන සංඛ්‍යාව |
|---|---|---|
| 1947 | 181 | 21 |
| 1952 | 85 | 12 |
| 1956 | 64 | 08 |
| 1960 මාර්තු | 167 | 07 |
| 1960 ජූලි | 45 | 07 |
| 1965 | 106 | 06 |
| 1970 | 136 | 02 |
| 1977 | 295 | 01 |

මූලාශ්‍රය: මැතිවරණ කොමිෂන් වාර්තා

ඉහත වගුවේ සඳහන් පරිදි 1947 දී ස්වාධීන අපේක්ෂකයන් 21 දෙනෙකු පාර්ලිමේන්තුව නියෝජනය කළ ද, 1977 වන විට පාර්ලිමේන්තුවේ ආසන හිමිකර ගත හැකි වූයේ එක් ස්වාධීන අපේක්ෂකයෙකුට පමණි. මේ අනුව පාර්ලිමේන්තු නියෝජනය තුළ ස්වාධීන අපේක්ෂකයන්ගේ ප්‍රබල පසු බෑමක් දක්නට ලැබේ.

ස්වාධීන අපේක්ෂකයන්ගේ පසුබෑම පිළිබඳව කැල්වින් ඒ. වුඩ්වර්ඩ් නැමැති විචාරකයා ලංකාවේ පක්ෂ ක්‍රමයක වර්ධනය යන අරුතැති ඉංග්‍රිසියෙන් පළ කරන ලද කෘතියෙහි 1960 ගණන්වල දී ඉදිරිපත්

කළ අදහස් අදට ද වලංගුය. ඒවා කෙටියෙන් පහත සඳහන් පරිදි වේ.

එම අදහස් අතර ස්වාධීන අපේක්ෂකයන්ට අධික මැතිවරණ පිරිවැයක් දැරීමට සිදුවීම සඳහන් වේ. 1959 දී ඇති කළ අංක 11 දරණ මැතිවරණ සංශෝධන පනත මගින් එතෙක් පැවති රුපියල් 1000 ඇප මුදල් ප්‍රමාණය පිළිගත් දේශපාලන පක්ෂ වල අපේක්ෂකයන් සඳහා රුපියල් 500 දක්වා අඩු කරන ලදි. එය 1964 දි තවදුරටත් රුපියල් 250 දක්වා පහත දමන ලදි. නමුත් ස්වාධීන අපේක්ෂකයෙකුගේ ඇප මුදල වන රු. 1000 ලෙස එලෙසම පැවතුණි.

ස්වාධීනව මැතිවරණයකට තරඟ කිරීමේ වාසියක් තිබුණ ද, ස්වාධීන මන්ත්‍රීවරයෙකු සේ සිටීම පෞද්ගලික වශයෙන් මෙන්ම ඡන්ද කොට්ඨාශ සම්බන්ධයෙන් ද අවාසි සහගත කරුණක් වීම ඔහු විසින් ඉදිරිපත් කර ඇති තවත් අදහසකි. මේ අනුව වඩා වාසිදායක වන්නේ ප්‍රබල පක්ෂයකට බැඳීම බව ස්වාධීන අපේක්ෂකයන්ට වැටහීම තුළින් ස්වාධීන අපේක්ෂකයන්ගේ පසුබෑමට එය හේතු විය.

කල්යාමේදී සාමාන්‍ය මහජනයාගේ දේශපාලන අවබෝධය වැඩිවීමේ ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රබල දේශපාලන පක්ෂ සඳහා ඡන්දය පාවිච්චි කිරීමට මහජනයා වඩ වඩාත් පෙළඹීම හේතුවෙන් ද ස්වාධීන අපේක්ෂකයන්ගේ පාර්ලිමේන්තු නියෝජනය පහළ වැටීම සිදු වී ඇත.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ බිහිවීම ද ඔහු විසින් සඳහන් කෙරෙන්නකි. ප්‍රථමයෙන්ම මෙම පක්ෂය බිහිවීමත් සමඟම ස්වාධීන අපේක්ෂකයෝ විශාල වශයෙන් එම පක්ෂය වෙත ඇදී ගියහ. දෙවනුව ශ්‍රී. ල. නි. පක්ෂය, එක්සත් ජාතික පක්ෂයට මාක්ස්වාදී නොවන විකල්පයක් ලෙස පමණක් නොව එක්සත්

ජාතික පක්ෂයට විකල්ප ආණ්ඩුවක් සැකසීමට තරම් ප්‍රබල පක්ෂයක් ලෙස පක්ෂ ක්‍රමය තුළ වර්ධනයවීම ද, ස්වාධීන අපේක්ෂකයන්ට හිමිව තිබූ ඡන්ද සංඛ්‍යාව අඩු වීමට හේතු විය.

ඉහත කරුණුවලට අමතරව, ස්වාධීන අපේක්ෂකයන් මැතිවරණ තරඟ බිමෙන් සම්පූර්ණයෙන්ම ඉවත් වීමට, 1978 දෙවන ජනරජ ව්‍යවස්ථාවෙන් හඳුන්වා දුන් සමානුපාතික නියෝජන ක්‍රමය සෘජුවම ඉවහල් වී ඇත. මෙම නියෝජන ක්‍රමය හඳුන්වා දුන් ලැයිස්තු ක්‍රමය නිසා ස්වාධීනව පුද්ගලයන්ට මැතිවරණ වලට ඉදිරිපත් වීමට නො හැකි විය. මෙහි සෘජු ප්‍රතිඵලය වූයේ ස්වාධීන අපේක්ෂකයන් සම්පූර්ණයෙන්ම මැතිවරණ වේදිකාවෙන් ඉවත් වීමයි.

දෙවන ජනරජ ව්‍යවස්ථාවේ 99 (2) වන වගන්තියේ විධි විධාන අනුව, ඕනෑම පක්ෂයකට හෝ ස්වාධීන අපේක්ෂකයන්ට හෝ යම් මැතිවරණ දිස්ත්‍රික්කයකට තරඟ වැදීමට අවශ්‍ය නම් ඒ සඳහා කණ්ඩායමක් ලෙස සෑදී නාමයෝජනා ඉදිරිපත් කළ යුතුය. මේ අනුව ස්වාධීන පුද්ගලයින් කිප දෙනෙකුගෙන් සැදුම් ලත් ස්වාධීන කණ්ඩායම් මැතිවරණ ප්‍රවාහයට එක් වූහ. මීළඟට පාර්ලිමේන්තුව තුළ, මෙම ස්වාධීන කණ්ඩායම් වල යම් වර්ධනාත්මක නැඹුරුවක් 1977 න් පසුව දැකිය හැකි වේ.

1989 මහා මැතිවරණයට ස්වාධීන කණ්ඩායම් 10 ක් යටතේ අපේක්ෂකයන් 97 දෙනෙකු තරඟ වැදුණු අතර, ඉන් ස්වාධීන කණ්ඩායම් තුනක අපේක්ෂකයන් 12 දෙනෙකුට පාර්ලිමේන්තුව තුළ ආසන හිමිකර ගත හැකි විය.

| ස්වාධීන කණ්ඩායම් | හිමිකර ගත් ආසන සංඛ්‍යාව |
|---|---|
| ස්වාධීන කණ්ඩායම් 1 (යාපනය) | 08 |
| ස්වාධීන කණ්ඩායම් 2 (මඩකලපුව) | 02 |
| ස්වාධීන කණ්ඩායම් 1 (ත්‍රිකුණාමලය) | 02 |

1994 පාර්ලිමේන්තු මහා මැතිවරණයේදී ස්වාධීන කණ්ඩායම් 26 ක් යටතේ අපේක්ෂකයන් 278 දෙනෙක් මැතිවරණයට ඉදිරිපත් වූ අතර, ඉන් ස්වාධීන කණ්ඩායම් දෙකක නියෝජිතයන් දස දෙනෙක් (10) පාර්ලිමේන්තුවට තේරී පත්වූහ.

| කණ්ඩායම් | හිමිකර ගත් ආසන සංඛ්‍යාව |
|---|---|
| ස්වාධීන කණ්ඩායම් 1 (නුවරඑළිය) | 01 |
| ස්වාධීන කණ්ඩායම් 2 (යාපනය ) | 09 |

ඉහත දත්ත අනුව, සමානුපාතික නියෝජන ක්‍රමය හඳුන්වාදුන් පසුව, ස්වාධීන කණ්ඩායම් වල යම් වර්ධනයක් පෙන්නුම් කරන ආකාරය දැකගත හැකිවේ. එසේම පාර්ලිමේන්තුව තුළ නියෝජනය හිමිකරගත් මෙම ස්වාධීන කණ්ඩායම් විශේෂයෙන්ම දුළු ජාතින් වෙසෙන උතුරු නැගෙනහිර හා මධ්‍යම පළාතට පමණක් සීමා වීම මිළහට දැකිය හැකි විශේෂ ලක්ෂණයකි. එයට හේතුව මෙම කණ්ඩායම් ද්‍රවිඩ ජන වර්ගය නියෝජනය කරන ස්වාධීන කණ්ඩායම් වීමයි.

## 4 වාමාංශික පක්ෂවල පසුබෑම

1947 හා 1952 මහා මැතිවරණවල දී මෙරට පාර්ලිමේන්තුවේ විරුද්ධ පක්ෂ ලෙස වැජඹුණු වාමාංශික පක්ෂ, (ල.ස.ස.ප., කො.ප., කම්කරු පක්ෂය බෝල්ෂෙවික් ලෙනින් පක්ෂ) 1977 මහා මැතිවරණයත් සමඟ දරුණු පසුබෑමකට ලක්විය. මෙම පසුබෑම මෙරට පක්ෂ ක්‍රමය තුළ පවතින්නා වූ ප්‍රවණතාවක් ලෙස පෙන්වා දිය හැකිය.

| මැතිවරණය | අපේක්ෂක සංඛ්‍යාව | දිනාගත් ආසන සංඛ්‍යාව |
|---|---|---|
| 1947 | 51 | 18 |
| 1952 | 58 | 13 |
| 1956 | 30 | 17 |
| 1960 මාර්තු | 143 | 23 |
| 1960 ජූලි | 83 | 19 |
| 1970 | 36 | 25 |
| 1977 | 134 | 0 |
| 1989 | 365 | 05 |

මූලාශ්‍රය- මැතිවරණ කොමිසන් වාර්තා

ඉහත සංඛ්‍යා සටහන අනුව 1977 දක්වා පාර්ලිමේන්තුව තුළ වාමාංශික පක්ෂවලට ප්‍රබල නියෝජනයක් හිමිව තිබුණු බව මනාව පැහැදිලි වේ. 1947 සිට 1970 දක්වා තනි පක්ෂ ලෙසත්, එසේම පෙරමුණු ලෙසත් මෙම පක්ෂ පාර්ලිමේන්තුව තුළ පුළුල් නියෝජනයක් හිමිකර ගත්හ. 1970 දී වාමාංශික පක්ෂ (1947 මැතිවරණය හැරුනවිට) තම පක්ෂ ඉතිහාසයේ විශාලතම පාර්ලිමේන්තු නියෝජනය අත්පත් කරගත්තා ලදි. එනම් එම මැතිවරණයේදී වාමාංශික පක්ෂ වලින් අපේක්ෂකයන් 36 දෙනෙක් මැතිවරණයට ඉදිරිපත් වූ අතර, ඉන් 25 දෙනෙක් ම පාර්ලිමේන්තුවට තේරී පත්වූහ. නමුත් 1977 මැතිවරණයත් සමඟ තත්වය සම්පූර්ණයෙන්ම වෙනස් විය. එකී මැතිවරණයත් සමඟ මෙරට වාමාංශික

ව්‍යාපාරයට අඳුරු කාල පරිච්ඡේදයක් හිමි වූවා යැයි පැවසීම වඩාත් නිවැරදි වේ. එනම්, සියලු වාමාංශික පක්ෂවල අපේක්ෂකයන් 134 ක් 1977 මහා මැතිවරණයට ඉදිරිපත් වූව ද, ඉන් කිසිවෙකුටත් පාර්ලිමේන්තුව තුළ එකම ආසනයක් වත් හිමිකර ගත නොහැකිවිය. වාමාංශික පක්ෂ අනුව බලන විට ල.ස.ස. පක්ෂයේ අපේක්ෂකයෝ 80 දෙනෙකු මැතිවරණයට ඉදිරිපත් වූවද, ඉන් කිසිවෙකුටත් පාර්ලිමේන්තුවට පැමිණිය නොහැකිවිය. කොමියුනිස්ට් පක්ෂයෙන් අපේක්ෂකයෝ ආසන 25 කට තරඟ වැදුනද ඔවුනට කිසිම අඩුනක් හිමිකර ගත නොහැකි විය. එසේම මහජන එක්සත් පෙරමුණ ආසන 27 කට තම අපේක්ෂකයන් ඉදිරිපත් කළද, ඔවුහු සියලු දෙනාම පරාජයට පත්වූහ.

1977 සිට මෙරට පැවැත්වූ අතුරු මැතිවරණවල ප්‍රතිඵල පරීක්ෂා කර බැලීමේන්ද, වාමාංශික පක්ෂවල දුබලතාව තවදුරටත් පැහැදිලි කර ගත හැකිය. 1977 සිට 1986 දක්වා මෙරට අතුරු මැතිවරණ 28 ක් පැවැත්වූ අතර, වාමාංශික පක්ෂවලට ඉන් දිනාගත හැකිවූයේ ආසන දෙකක් පමණි. එනම් 1981 දී කොමියුනිස්ට් පක්ෂයේ සරත් මුත්තෙට්ටුවේගම මහතා දිනාගත් කලවාන ආසනයත්, 1985 දි මහජන එක්සත් පෙරමුණේ දිනේෂ් ගුණවර්ධන මහතා දිනාගත් මහරගම ආසනයත් යන ආසන දෙක පමණි.

තවද, 1982 මැතිවරණයේ දි ල.ස.ස. පක්ෂයට හිමිකර ගත හැකිවූයේ 0.88% ක ඡන්ද ප්‍රතිශතයකි. න.ස.ස. පක්ෂයට හිමිකර ගත හැකි වූයේ 0.26% ක ප්‍රතිශතයකි. ජනතා විමුක්ති පෙරමුණ ඡන්ද 4.19% ක ප්‍රතිශතයක් හිමිකර ගත්තේය. 1989 පාර්ලිමේන්තු මහා මැතිවරණයේ දි වාමාංශික පක්ෂ සියල්ලම එකතුව එක්සත් සමාජවාදී පෙරමුණ ලෙස තරග වැදුනද, ජාතික ලැයිස්තුව මගින් ලද අපේක්ෂකයා ඇතුළුව පාර්ලිමේන්තුවට තේරී පත් වූයේ

නියෝජිතයන් තිදෙනෙක් පමණි. ඉන් පැහැදිලි වූයේ වාමාංශික පක්ෂ සියල්ල එකතු වුවද ඔවුනට පාර්ලිමේන්තුව තුළ ප්‍රබල නියෝජනයක් අත්පත් කරගත නොහැකි බවයි. මෙහිදී මහජන එක්සත් පෙරමුණ ඉහත මැතිවරණයට තරග වැදිමට අපේක්ෂකයන් 159 ක් ඉදිරිපත් කළද, ඉන් ආසන දිනාගත හැකිවූයේ දෙදෙනෙකුට පමණි.

1994 මහා මැතිවරණයේ දි ල.ස.ස පක්ෂය, කොමියුනිස්ට් පක්ෂය, ශ්‍රී ලංකා මහජන පක්ෂය යන වාමාංශික පක්ෂ, පොදුජන එක්සත් පෙරමුණ සමඟ එකතු වී මැතිවරණයට තරඟ කළද, ජාතික ලැයිස්තුවෙන් පත්වූ නියෝජිතයන් දෙදෙනා ඇතුළුව පාර්ලිමේන්තුවේ ආසන දිනාගත හැකිවූයේ හය දෙනෙකුට පමණි. එම ආසන 06 වුවද ලබා ගැනීමට හැකිවූයේ ශ්‍රී ල.නි. පක්ෂය සමඟ සභාග ගතවී සිටිය නිසාය. මෙම සභාගයට සම්බන්ධ නොවී වෙනමම තරග වැදුණු අන් වාමාංශික පක්ෂවල තත්ත්වය ඉතාමත් ඛේදජනක විය. ශ්‍රී ලංකා ප්‍රගතිශීලි පෙරමුණ අපේක්ෂකයන් 232 ක් ඉදිරිපත් කළ අතර, ඉන් පාර්ලිමේන්තුවට තේරී පත් වූයේ එක් මන්ත්‍රීවරයෙකු පමණි. ම.එ.පෙරමුණ 159 දෙනෙකු ඉදිරිපත් කළද කිසිවෙකුට ජයග්‍රහණය කළ නොහැකි විය. නව සම සමාජ පක්ෂය අපේක්ෂකයන් 32 ක් ඉදිරිපත් කළද, ඔවුන් සියලු දෙනාම පරාජයට පත් විය. ඉහත විග්‍රහයෙන් පෙනී යන්නේ වර්තමානයේ වාමාංශික පක්ෂ වල පවතින ප්‍රබල අවපාතයයි.

පාර්ලිමේන්තුවෙන් පරිබාහිරව වෘත්තීය සමිති මට්ටමෙන් ගත් විටද, අද වාමාංශික පක්ෂවල වෘත්තීය සමිති ඉතාමත් මන්දගාමීව මෙන්ම, ජනතා පදනමෙන් ඈත්ව ද පවතී. 70 දශකයට පෙර මෙරට වෘත්තීය සමිති ව්‍යාපාරයේ වාමාංශික වෘත්තීය සමිති වලට තිබූ ප්‍රබල ජනතා පදනම අද පසුබෑමට ලක් වී ඇත. මෙරට ප්‍රධාන පක්ෂ දෙක

වන එ.ජා. පක්ෂය හා ශ්‍රී.ල.නි. පක්ෂය යන පක්ෂවල වෘත්තිය සමිති වටා කම්කරුවන් ඒක රාශි වී ඇත. පැරණි වාමාංශික පක්ෂවල ශිෂ්‍ය සංගම් දෙස බලන විට ද පෙනී යන්නේ වෘත්තිය සංගම්වලට අත්වූ ඉරණම ඒවාට ද අත් වී ඇති බවයි.

## 5 ප්‍රධාන පක්ෂවලින් කැඩී වෙනම පක්ෂ පිහිටුවා ගැනීම හා එම පක්ෂනායකයින් නැවත තම මව් පක්ෂ කරා පුනරාගමනය වීම

මෙයද, අතීතයේ මෙන්ම වර්තමානයේ ද මෙරට පක්ෂ ක්‍රමය තුළ දකගත හැකි තවත් ප්‍රවණතාවකි. ඒ අනුව 1983 දි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ විජය – චන්ද්‍රිකා පිරිස ඉවත්ව, 1984 ජනවාරි 22 දා ශ්‍රී ලංකා මහජන පක්ෂය බිහිකර ගත් අතර, විජයගේ මරණයෙන් පසුව නැවත චන්ද්‍රිකා කුමාරණතුංග ඇතුළු පිරිස ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙත පුනරාගමනය වී ඇත. එසේම ආරිය බුලේගොඩ, මර්වින් සිල්වා ඇතුළු පිරිසක් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් ඉවත් වී ශ්‍රී ලංකා ප්‍රගතිශීලී පෙරමුණ පිහිටුවා ගත්හ.

1986 දී එක්සත් ජාතික පක්ෂයෙන් ඉවත්වූ රුක්මන් සේනානායක, වෛද්‍ය ගාමිණී විජේසේකර ප්‍රමුඛ පිරිස එක්සත් ලංකා ජනතා පක්ෂය නමින් පක්ෂයක් පිහිටුවා නොබෝ කලකින්ම එනම් 1990 ජුලි මස 01 වන දින, එය විසුරුවා හැර අනතුරුව 1994 දී එක්සත් ජාතික පක්ෂයට එකතු වූහ. 1991 දී ප්‍රේමදාස ජනාධිපතිවරයාට එරෙහිව, දෝෂාභියෝගයක් ඉදිරිපත් කිරීම හේතුකොටගෙන ලලිත් ඇතුලත්මුදලි, ගාමිණී දිසානායක, ජී.එම්. ප්‍රේමචන්ද්‍ර, සමරවීර වීරවන්නි, ප්‍රේමරත්න ගුණසේකර යන අයවලුන් එක්සත් ජාතික පක්ෂයෙන් නෙරපා දැමූ අතර, ඔවුහු ප්‍රජාතන්ත්‍රවාදී එක්සත් ජාතික පෙරමුණ නමින් නව පක්ෂයක් බිහිකර ගත්හ. 1994

දී එහි ප්‍රබල නායකයන් වූ ගාමිණී දිසානායක, ජී.එම්. ප්‍රේමචන්ද්‍ර ආදීහු නැවත, මව් පක්ෂය වූ එක්සත් ජාතික පක්ෂය වෙත ගියහ. තවද, ලංකා සම සමාජ පක්ෂයෙන් ඉවත් වූ වාසුදේව නානායක්කාර මහතා, ආචාර්ය වික්‍රමබාහු කරුණාරත්න මහතා සමඟ එක්වී නව ලංකා සම සමාජ පක්ෂය පිහිටුවා ගත්තේය. කාලයාගේ ඇවෑමෙන් නැවත වාසුදේව නානායක්කාර මහතා 1994 දී තම මව් පක්ෂය වූ ලංකා සම සමාජ පක්ෂය කරා සපැමිණියේය. දැනට ආණ්ඩු පක්ෂයේ අඩුන් ගෙන සිටින ශ්‍රීමනී ඇතුලත්මුදලි, රවී කරුණානායක යන අයගෙන් සමන්විත ප්‍ර.එ.ජා.ප. (ශ්‍රීමනී පිල), නැවත එක්සත් ජාතික පක්ෂය වෙත යාමට කල් යල් බලමින් සිටියි.

මේ ලෙසින් 1977 න් පසු කාල පරිච්ඡේදය තුළ ප්‍රධාන පක්ෂවලින් කැඩී යාමත්, ඇතැම් එබඳු පක්ෂ, තම මව් පක්ෂ කරා පුනරාගමනය කිරීමත්, මෙරට පක්ෂ ක්‍රමය තුළ දැකගත හැකි බහුල සංසිද්ධියකි.

## 6 ප්‍රධාන පක්ෂවලින් කැඩී ගිය පක්ෂ, නැවත නැවතත් පිල් වශයෙන් බෙදීයාම

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් කැඩී ගිය ශ්‍රී ලංකා මහජන පක්ෂයේ එක කණ්ඩායමක් ශ්‍රී ලංකා මහජන පක්ෂය (ඔසී පිල) වශයෙනුත්, තවත් කණ්ඩායමක් ශ්‍රී ලංකා මහජන පක්ෂය (වයි.පි පිල) වශයෙනුත්, නව සම සමාජ පක්ෂය (බාහු පිල සහ වාසු පිල) වශයෙනුත් තවදුරටත් කැඩී ගියේය. තවද, එ.ජා.පක්ෂයෙන් බිඳී ගිය ප්‍රජාතන්ත්‍රවාදී එක්සත් ජාතික පෙරමුණ නැවත ලලිත් පිල වශයෙනුත්, ගාමිණී පිල වශයෙනුත් ප්‍රධාන කණ්ඩායම් දෙකකට බෙදී ගියේය. මේ අනුව පැහැදිලි වන්නේ ප්‍රධාන පක්ෂවලින් කැඩීගිය පක්ෂ,

නැවත නැවතත් පිල් විශයෙන් බෙදී යාමද, මෙරට පක්ෂ ක්‍රමය තුළ පවතින ප්‍රවණතාවක් බවයි.

## 7 උතුරේ සහ දකුණේ ප්‍රචණ්ඩත්වය මත පදනම් වූ සන්නද්ධ පක්ෂ ඇතිවීම

මෙයද 1977 න් පසු මෙරට පක්ෂ ක්‍රමය තුළ ඇතිවූ නව ප්‍රවණතාවයක් ලෙස දක්විය හැකිය. ඒ අනුව උතුරු - නැගෙනහිර වෙනම ඊලාම් රාජ්‍යයක් බිහිකර ගැනීම සඳහා ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රවාහයෙන් වෙන්වූ, විවිධ සන්නද්ධ සංවිධාන ඇතිවිය. ඒවා නම්, එල්.ටී.ටී.ඊ. ටෙලෝ, ප්ලොට්, ඊ.පී.ඩී.පී., ඊ.පී.ආර්.එල්.එෆ්, ඊරෝස් යන සංවිධානයන්ය. මෙයින් එල්.ටී.ටී.ඊ. සංවිධානය හැර අන් සංවිධාන 1987 ඉන්දු - ලංකා ගිවිසුම ක්‍රියාවට ඒමත් සමඟ ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රවාහයට එළඹුනු නමුදු තවදුරටත් එම සංවිධාන තම ආරක්ෂාවට යයි පවසමින් සන්නද්ධව සිටිති.

දකුණේ ජනතා විමුක්ති පෙරමුණ, හිටපු ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන මහතා විසින් තහනම් කිරීමත් සමඟ, එය ආයුධ සන්නද්ධ සංවිධානයක් ලෙස කටයුතු කළේය. පසුව එසේ සන්නද්ධව සිටිය දීම ආර්. ප්‍රේමදාස ජනාධිපතිවරයා එම පක්ෂය රජය පිළිගත් පක්ෂයක් බවට පත් කළේය. දැන් නැවතත් ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රවාහයට එම පක්ෂය එක්වී ඇත.

## 8 වාර්ගික පක්ෂවල සංඛ්‍යාත්මක වර්ධනය

1977 න් පසුව ඉන් පෙර නොවූ විරූ අයුරින්, ද්‍රවිඩ, මුස්ලිම්, සිංහල යන ජන වර්ගවලට අයත්, වර්ගවාදී පක්ෂ බිහිවන ආකාරය මිළභට පෙන්වා දිය හැකි තවත් ප්‍රවණතාවකි. ඒ අනුව මහා සම්මත භූමිපුත්‍ර පක්ෂය, ජනතා මිතුරෝ වැනි සිංහල වාර්ගික පක්ෂත්, ද්‍ර.එ.වි.පෙරමුණ, එල්.ටී.ටී.ඊ. ටෙලෝ, ඊරෝස්, ප්ලොට්, ඊ.පී.ඩී.පී. සහ ඊ.පී.ආර්.එල්.එෆ්

වැනි ද්‍රවිඩ වාර්ගික පක්ෂත්, ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය, මුස්ලිම් එක්සත් විමුක්ති පෙරමුණ වැනි මුස්ලිම් වාර්ගික පක්ෂත් බිහිවිය. මෙලෙස වාර්ගික පක්ෂ බිහිවීම කෙරෙහි මෙරට ජනවාර්ගික අර්බුදය සෘජු ලෙස බලපා ඇති බව පෙනේ.

## 9 සෑම පක්ෂයකම අඩු වැඩි වශයෙන් පක්ෂ නායකත්වයේ අධිපතිත්ව බලය වර්ධනය වීම

ඉහත ප්‍රවණතාව ද 1977 න් පසු මෙරට පක්ෂ ක්‍රමය තුළ දක්නට ඇති තවත් ලක්ෂණයකි. පක්ෂ නායකත්වයේ අධිපතිත්වය වර්ධනය වීම සම්බන්ධව බලපා ඇති දේශපාලන පක්ෂ මාරුකිරීම් තහනම් කරමින් සාමාන්‍ය මන්ත්‍රීවරුන්ට පනවා ඇති තහනම, සමානුපාතික නියෝජනයේ ලැයිස්තු ක්‍රමයට අනුව පක්ෂ නායකයනට ඇති අසීමිත බලතල හා විධායක ජනාධිපති ක්‍රමය, කරුණු වශයෙන් පෙන්වා දිය හැකිය.

ඉහත කරුණු නිසා මෙරට සෑම පක්ෂයකම නායකත්වයේ බල මහිමය ඉතා දැඩි ලෙස වර්ධනය වී ඇත. මේ නිසා පක්ෂ නායකයා කුමක් කළ ද, තමන්ගේ දේශපාලන අනාගතය ආරක්ෂා කර ගැනීමට නම් නායකයාට වඩ වඩාත් වන්දනාමාන කිරීමේ තත්ත්වයකට සාමාන්‍ය මන්ත්‍රීවරයා පත්ව ඇත. එසේ නොකළහොත් සිදුවන්නේ තමාගේ දේශපාලන මිනී වළ තමාගේ අතින් ම කපා ගැනීමටය. මෙම පක්ෂ නායකත්වයේ අධිපතිත්ව බලය වර්ධනය වීම පිළිබඳ පෙන්වා දිය හැකි හොඳම උදාහරණය නම් හිටපු ජනාධිපති ආර්. ප්‍රේමදාස මහතාට එරෙහිව දෝෂාභියෝගයක් ගෙන ආ ලලිත්, ගාමිණී ඇතුළු පිරිස එක්සත් ජාතික පක්ෂයෙන් එළවා දැමීමයි.

## 10 ප්‍රධාන පක්ෂ දෙක අතර ආර්ථිකමය ප්‍රතිපත්ති අතින් පොදු එකඟතාවක් පිළිබිඹු කිරීම

මෙය ද මෙරට පක්ෂ ක්‍රමය තුළ දක්නට ඇති නව ප්‍රවණතාවක් ලෙස පෙන්වා දිය හැකිය. එක්සත් ජාතික පක්ෂය විවෘත ආර්ථිකය හඳුන්වා දුන් අතර, එයට මානුෂික මුහුණුවරක් දීම යන තේමාව යටතේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ පොදු පෙරමුණ ද, මෙවර මැතිවරණ ප්‍රකාශනයෙහි විවෘත ආර්ථික ප්‍රතිපත්ති තම ආර්ථික ප්‍රතිපත්ති ලෙස ඉදිරිපත් කොට ඇත. මෙය තවදුරටත් සනාථ කිරීම සඳහා එක්සත් ජාතික පක්ෂය හා පොදුජන එක්සත් පෙරමුණ යන පක්ෂ තම තමන්ගේ ප්‍රතිපත්ති ප්‍රකාශනවල ආර්ථික කරුණු සම්බන්ධව කර ඇති ප්‍රකාශන මෙහිදී සලකා බැලිය හැකිය.

පොදුජන එක්සත් පෙරමුණේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ස්වකීය ආර්ථික ප්‍රතිපත්ති පිළිබඳව මෙසේ සඳහන් කර ඇත.

> "නිදහස් ආර්ථික රාමුවක් තුළ ශක්තිමත් දේශීය ආර්ථිකයක් ගොඩ නැගීම පොදුජන එක්සත් පෙරමුණේ අභිප්‍රායයි"

> "තාක්ෂණය, විද්‍යාත්මක අභිවෘද්ධිය, ආයෝජනය, කළමනාකරණය සහ මූල්‍ය සහ රැකියා නියුක්තිය යන ක්ෂේත්‍රයන් තුළ වේගවත් වර්ධනයක් ඇතිකර ගැනීම උදෙසා දේශීය හා විදේශීය ආයෝජකයන්ට සියලු පහසුකම් ලබා දෙන්නෙමු".

> "පෞද්ගලික අංශයට සතුටුදායක ලෙස කළහැකි සියලු ආර්ථික කටයුතුවල යෙදීම සඳහා ඔවුන්ට

පූර්ණ නිදහස ලබා දෙනු ඇත. වෙළඳපොළේ බලවේග හා මිල ගණන් අනුව රජයේ පාලන නීතිරීතිවලින් තොරව මෙම කටයුතුවල යෙදීම සඳහා පෞද්ගලික අංශයට පහසුකම් සලසනු ඇත. ඒ යටතේ ආනයනය අනවශ්‍ය ලෙස සීමා නොකෙරේ. මේ කටයුතුවල වගකීම හා විවෘතභාවය සහතික කිරීම සඳහා අවශ්‍ය නීතිමය රාමුවක් සකස් කිරීම රජයේ කාර්යභාරයේ කොටසක් ලෙස අපි පිළිගන්නෙමු".

ඉහත ප්‍රතිපත්ති ප්‍රකාශයේ වගන්ති මගින් පොදුජන එක්සත් පෙරමුණ රජයද, නිදහස් වෙළඳපොල ආර්ථිකය තම ආර්ථිකයේ ප්‍රධාන තේමාව කොටගෙන ඇති බව පෙනී යයි.

මීළඟට එක්සත් ජාතික පක්ෂය විසින් තම ආර්ථික ප්‍රතිපත්ති අවධාරණය කර තිබෙන ආකාරය විමසා බැලිය යුතුය. එක්සත් ජාතික පක්ෂයේ 1994 ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ස්වකීය ආර්ථික ප්‍රතිපත්ති මෙසේ ඉදිරිපත් කොට ඇත.

"ආර්ථික සංවර්ධනයේ යතුර ආයෝජනයයි. අපගේ සංවර්ධන තන්ත්‍රය විසින් නොකඩවාම විශේෂ අවධානය යොමු කරනු ලබන්නේ අපනයනයට මූල්තැන දෙන සංවර්ධනයටයි. එහිදී ප්‍රමුඛස්ථානය ගනු ඇත්තේ පෞද්ගලික අංශය ය. ස්ථාවර වූත්, පැහැදිලි වූත්, හදිසියේ වෙනස් නොවන දුළු වූත්, වෙළඳපොළ න්‍යායයට අනුකූල වූත්, ප්‍රතිපත්ති මගින් රජය විසින් දේශීය

හා විදේශීය පෞද්ගලික අංශය විසින් කෙරෙන ආයෝජනයන්ට ධෛර්යය දෙමින් ඒ ආයෝජන පහසු කරනු ඇත. මෙහි ලා රජය මැදිහත්වීමේ ප්‍රමාණය අඩු කරනු ලබන්නේ රජයේ අයවැය ප්‍රතිව්‍යුහකරණයෙනුත්, පෞද්ගලික ව්‍යවසාය පිළිබඳ ප්‍රතිසංවිධාන මගිනුත්ය".

එසේම එහි තවත් තැනෙක,

"ආයෝජනයන්ගේ ආරක්ෂාව ඉතා වැදගත් බව අපි පිළිගනිමු. යමෙකුගේ ආයෝජනයේ හෝ අයිතියේ සුරක්ෂිතභාවයට හානි කරන කිසිම පියවරක් ගැනීමෙන් වැළකී සිටින බව අපි ආයෝජකයන්ට සහතික කරන්නෙමු."

එක්සත් ජාතික පක්ෂය හා පොදුජන එක්සත් පෙරමුණ 1994 ස්වකීය මැතිවරණ ප්‍රකාශනයන්හි සඳහන් කර තිබූ ඉහත ආර්ථික ප්‍රතිපත්ති දෙස තුලනාත්මකව බැලීමේදී මෙම ප්‍රධාන පක්ෂ දෙක විසින්ම නිදහස් වෙළෙඳපොළ ආර්ථිකය පිළිගැනීම සහ පෞද්ගලික ව්‍යවසායකය මත පදනම් වූ දේශීය හා විදේශීය ආයෝජනයන්ට, මෙරට ආර්ථිකය තුළ ප්‍රමුඛස්ථානය ලබා දීම යන කරුණු දෙක පැහැදිළි වෙයි.

ආර්ථික කරුණු අතින් මෙවැනි පොදු ප්‍රතිපත්ති අනුගමනය කිරීමට මෙරට ප්‍රධාන දේශපාලන පක්ෂ දෙක සැදී පැහැදී සිටීම, 1977 න් පසු මෙරට පක්ෂ ක්‍රමයේ ප්‍රධාන දේශපාලන පක්ෂ දෙක සම්බන්ධව දක්නට ලැබෙන නව හැඩගැසීමක් ලෙස පෙන්වා දිය හැකිය. බ්‍රිතාන්‍ය පක්ෂ ක්‍රමය තුළ

එරට ප්‍රධාන පක්‍ෂ දෙක වන කොන්සර්වේටිව් හා ලේබර් පක්‍ෂය ආර්ථික ප්‍රතිපත්ති අරබයා අනුගමනය කරන්නේ ද එකිනෙකට සමාන්තරව යන ප්‍රතිපත්තීන්ය. එක් පක්ෂයක් බලයට පත් වූ විට, එතෙක් බලයේ සිටි පක්‍ෂය ගේන ගිය ආර්ථික ප්‍රතිපත්ති වෙනස් කිරීමක් එරට ප්‍රධාන පක්‍ෂ දෙකින් එකදු පක්‍ෂයක්වත් නොකරයි. බ්‍රිතාන්‍යයේ ආර්ථික ප්‍රතිපත්ති අතින් ඔවුන් පැමිණ තිබෙන පොදු එකඟතාව නිසා එම රටෙහි ආර්ථික සංවර්ධනය ඉදිරියටම වර්ධනයවේ. නමුත් ලංකාවේ මෑතක් වනතුරුම, ප්‍රධාන පක්‍ෂ දෙක වන ශ්‍රී ලංකා නිදහස් පක්‍ෂයත්, එක්සත් ජාතික පක්‍ෂයත් ආර්ථිකමය ප්‍රතිපත්ති අතින් එකිනෙකට ප්‍රතිවිරුද්ධ දිසාවකට ගමන් කර ඇත. එක් පක්‍ෂයක් බලයට පැමිණ රාජ්‍ය ආයතන පෞද්ගලිකරණය කරනවිට, අනික් රජය පැමිණ එම ආයතනයම නැවත ජනසතු කරයි. මෙයින් සිදුවූයේ එම ආයතන සංවර්ධනය වීම වෙනුවට තව තවත් ඌණ සංවර්ධිත වීමයි. නමුත් වර්තමානයේ එම තත්ත්වයෙන් බැහැර වී ප්‍රධාන පක්‍ෂ දෙකම, තම ආර්ථික ප්‍රතිපත්ති වලදී තේමාව ලෙස විවෘත ආර්ථික ප්‍රතිපත්ති යොදා ගැනීම මෙරට පක්‍ෂ ක්‍රමය තුළ ප්‍රධාන පක්‍ෂ දෙක ආර්ථිකමය කරුණු අතින් සමාන්තරව ගමන් කිරීම විදහා පාන්නක් බව මෙහිලා සඳහන් කළ හැකිය. මෙය ආර්ථික හා දේශපාලන වශයෙන් රටේ සංවර්ධනයට මහඟු රුකුලක් බවද පැවසිය හැකිය.

ඉහතින් සාකච්ඡා කරනු ලැබූයේ මෙරට පක්‍ෂ ක්‍රමයේ දක්නට ලැබෙන නව හැඩ ගැසීම් රාශියකි. ශ්‍රී ලංකා පක්‍ෂ ක්‍රමය දෙස නෙත් යොමු කරන විට, මෙකී ප්‍රවණතා අඩු වැඩි වශයෙන් දක්නට ලැබෙන බව, සක් සුදක් සේ පෙනී යන බව අවසාන විග්‍රහයේදී පැවසිය හැකිය.

# ආශ්‍රිත ග්‍රන්ථ


1. Abenayake, H.B.W. Amarathunge, H.P. *"Parliament of Ceylon 1970"*; The Associated News papers of Ceylon Limited, Lake House, Colombo, 1970.
2. Abeynayake, H.B.W. *"Parliament of Sri Lanka 1977"*; A.N.C. Limited, Lake House, Colombo, 1978.
3. Abeynayake, H.B.W. *"Parliament of Sri Lanka"*; A.N.C. Ltd., Lake House, Colombo. 1990.
4. De Silva, W.P.P. & Fernando, T.C.L. *"09th Parliament of Sri Lanka"* ; A.N.C. Ltd., Lake House, Colombo. 1990.
5. Woodward, C.A. *"The Growth of a Party System in Ceylon"*; Brown University Press 1969, Chap. vi, vii, page 211 - 230, page 232, 243.
6. Wiswa Warnapala, W.A. *"The Sri Lankan Political Sciene"*; Navrang, New Delhi. 1993. Chap. 13.
7. *2nd Republican Constitution of Sri Lanka 1978.*
8. පෙරේරා, ජී.ඇස්. සහ ගුණරත්න, ඩබ්.පී. *ශ්‍රී ලංකාවේ දසවැනි පාර්ලිමේන්තුව* සීමාසහිත ශ්‍රී ලංකා එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම ලේක් හවුස්, කොළඹ. 1995.
9. විශ්වා වර්ණපාල, ඩබ්.ඒ. *ශ්‍රී ලංකාවේ කාලීන දේශපාලනය,* ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, 1995.

# සමනළ "සිරිපද ලය" ලද රජ බැති පුද සහ කිවි පද පුද

## මා මෛත්‍රීපාල

ලොවැ නත් වග වස්තුන් ඇති වීමත්, ඒ අතරැ අසිරිමත් වස්තුන් ඉස්මතු වීමත් සොබාදහම. ඒ සොබාදහම් අසිරියට අමතරවැ කිවියන් විසින් මැවෙන ලොවක් ද එතුළැ පුදුම වස්තුන් ද ඇති ලෙසක් කියැවේ. එයින් එකකි, කිරි සයුර මැද මහමෙර නම් ගිරි - කුළ. සකු කිවියන්ගේ එවැන්නකි, කෙළෙස් කුළ හෙවත් කෛලාශය. ඒ කිවි නිමැවුම් අතරින් සැබෑ වස්තුහු ද වෙති. ආසියාවේ පෙරදිග දෙස, බුදුවරයන්- මුනිවරයන් පහළවන ඉසව්ව දක්වෙන ලකුණක් බදු හිමාලය කඳුවැටිය ද ලක්දිවෙහි මෙ කපට පහළ වූ සිවු බුදුවරයන්ගේ සිරිපා පහසින් පිවිතුරු විණැයි සැලකෙන සමනළ ගිර ද බුදුනු දනන් ගේ ඉමහත් ගරු බුහුමනට ලක් වූ ගිරිකුළු යැ.

බුදු රජාණන් වහන්සේගේ තුන්වැනි ලංකාගමනය සඳහන් කරමින්, එවරැ සමනළ ගිරිහිසැ සිරිපා සලකුණ පිහිටුවා වදාළ පුවත පොත්වලට ඇතුළත් කැරුණු වකවානුවේ සිටැ ලක්දිවැ බුදුනු දනෝ ද ලංකාවතූත්‍රය පොත්හි ඇතුළත් වුණු වකවානුවේ සිටැ දඹදිව මහායාන බුදුනු දනෝ ද සමනළ සිරිපා සලකුණ ඉමහත් බැතියෙන් වැඳුම්-පිදුම් කළහ. සුමන - සමන් සුරිඳුන්ගේ ඇරැයුමෙන් බුදු රජාණන් වහන්සේ සිය වම් සිරිපා සලකුණ සමනළ ගිරිහිසැ ඔබා පිහිටුවා වදාළ පුවත ඇසූ වෛදේහ හිමියෝ සමන්කුළු වැනුම- සමන්තකූට වර්ණනා නමින් පෙලබසින් කව් පබදක් කළහ. එම කව් පබදෙහි අඩුව සපුරන්නට මෙන්, හේන්පිටගෙදර ඤාණසීහ - මා හිමිපාණන් විසින් සමන්තකූට

වර්ණනා නමින් සකු කවක් ලියැවිණි. ඒ කවි පබඳෙහි,

දශබල ලාඤ්ඡනාභිවාඤ්ජා
ප්‍රතිගත වන්දනී කෙර ලඹ කෑෂතායම්
දිනමනු විලසත් ප්‍රදීප දීප්තඃ
සුමන ගිරිර් ගිරි රාජතා මවාතා

යනුවෙන්, බුදුන් වහන්සේගේ සිරිපා සලකුණ කෙරෙහි බැඳීමෙන් (ගුරු බැති හදින් යුතුව) පැමිණි වන්දනාකාර සමූහයෙන් අලංකාරව මේ සමන්ගිර දවසක් පාසා බබළන පහනින් ද යුක්තව මනහර වූයේ ගිරි රදුන් බවට පත්වූයේ යැයි සඳහන් කෙරිණ,

එලෙසින් නන්වග වැඳුම්කරුවන් - බැතිමතුන්, "සිරිපා සමනළ", නැඟීමට - නැඟ වැඳීමට වෙහෙස ගත් හැටි ද මෙයින්, (මෙම ලිපියෙන්) විමැසිල්ලක් කැරේ.

සමනළ සිරිපා වැඳුම, මීට වසර දෙදහසකට පමණ පෙර සිට පැවතිණැයි සිතිය හැකි මුත්, ඊට ඉතිහාසනයින් හේතුසාධකයෝ නොවෙති.

සුර රද සමන් සමඟින් සුරහන එවර
පැහැනඳ මදාරා - පරසතු මල් එතර
කැරැපුද වඳින රැඳි 'මුනි සිරිපා තඹර
සකි සඳ පෙනේ, සමනළ ගිර නැගෙන හිර

යනුවෙන් සමන් දෙවියනුත්, සුරලොව දෙවහනනුත් සිරිපා වැඳ පුදා ගත් බවට කවි සංකල්පනාවක් සිරි රහල් හිමියෝ සඳහන් කළහ.

නිසැක ලෙසින් මැ සිරිපා වැඳිම, මිනිසුන් විසින් ඇරැඹුණු වකවානුව සඳහන් කළ හැක්කේ, එකොළොස්වැනි සියවසර මැද අඩෙහි පමණේ සිට බවකි. සොළී බල බිඳ හැර සිරිලක එක්සේසත් කළ I වැනි විජයබාහු රජතුමා (1055 - 1111) පොළොන්නරුව රජදහන කැරැගෙන රජකම් කළ කල්හි සමනළ ගිර තරණය කොට සිරිපා නමැඳ, එහි රැකවරණයට කටයුතු ද සලසා සමනළ ගිරට පහළින් රත්නපුරයෙන් විහිදෙන මහ අසල වූ ගිලිමලය ගම පිදූ බව.

"සමන්කුළු පව්වෙහි පිහිටි මුනි රජුගේ පා
සටහන වඳනා පිණිස දූකසේ යායුතු මහ
යන්නා වූ මනුෂ්‍යයෝ නොපෙළෙත්ව යි දන්
වැටුප් පිණිස සියලු කල්හි සහල් කෙත්
ආදියෙන් සමෘද්ධ වූ ගිලිමලය නම් ගම දෙවි"

යනුවෙන් මහාවංශයෙහි සඳහන් යැ.

I වැනි විජයබාහු රජතුමන් සිරිපා වැඳුමේ යෙදුණා පමණක් නොව, සිරිපා වන්දනාකරුවන්ගේ පහසුව සඳහා රජරටින් එන මඟෙහි සිරිපා මළුවට ආසන්න ගම් පහේ ගව්වෙන් ගව්වට දන්සල් පිහිටැ වූ බව ද ඉදුඹුහල්, විශ්‍රාම ශාලා සුදුසු තැන්හි පිහිට වූ බව ද කියැවේ. සිරිපා සමනළ ගිරි මුදුනේ මළුව වටා පවුරක් ඉදි කොටැ දෙපසැ මං දෙකෙහි දොරටු තබවා දොරටුපාලයන් යෙදවූ බව ද සෙල්ලිපි - සටහන් මඟින් හෙළිවේ. තවද අඹගමුව සෙල්ලිපියෙහි, සිරිපා වෙහෙර වැය සඳහා අඹගමුව, කෙහෙල්ගමුව, තිතියගල, මදාලුවනය, සොරගොඩ, උලපනේ, ගම්පොළ ආදි සමනළ ගිර අසල් ගම් රැසක් සිරිපා - පූජනියස්ථානයට පුදා ඇති බව සෙල්ලිපි නයින් පැහැදිලි යැ.

ඉන් අනතුරුව වංශකතාවල ද සඳහන් පරිදි, සිරිපා සමනළ වැඳ පුදා ගත් රජකු පිළිබඳව සඳහන් වන්නේ I පැරකුම්බා (ක්‍රි.ව. 1153-1187) රජු සමයයි. එතුමා විසින් සමනළ ගිර නැග බුදු සිරිපා සලකුණ වැඳ සමනළ ගිරි මුදුනෑ සමන් දෙවොලක් ද ඉදි කැරැවූ බව සෙල්ලිපි මගින් හෙළිවේ. ඉන් අනතුරුව රජකමට පත්වූ කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල (1187 - 1196) රජතුමා සිය සෙබළ මුළක් සමඟ සමනළ ගිර නැග සිරිපා වැඳ පුදා ගත් බව මහා වංශයත් රාජාවලියත් මගින් කියැවේ. ලක්දිව වැඩිම සෙල්ලිපි ගණනක් පිහිටුවීමේ රජකු ලෙස සඳහන් කළ හැකි කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල රජතුමා විසින් පිහිටුවීණැයි සැලැකෙන සෙල්ලිපි හත - අටක ඉහත පුවත ඇතුළත් වේ.

දඹදෙණියේ රජසිරිපත් II වැනි පැරකුම්බා (1336 - 1370) රජතුමා සිව්රඟ සෙනග කැටුව සමනොළ ගිර නැඟ සිරිපා නමැද සිරිපා පූජනීයස්ථානයට ඒ ඒ දිගින් දස ගව්වක් මහ වනය සිසාරා පිහිටි ජනපද ගම් පිදූ බව පූජාවලියෙහි සඳහන් යැ. එතුමන්ගේ අගමැති දේවපතිරදුන් කැඳවා සමනළ සිරිපා වැඳීමට යන, වැඳ බසින අයට දෙස් වැසියන්ගේ හිංසාව පිණිස ජල දුර්ග, ගිරි දුර්ග, පංක දුර්ග මග හෙළි පෙහෙළි කරන නියෝග දී ඇත. II පැරකුම්බා නිරිඳුන්ගේ අණ පරිද්දෙන්, ගම්පොළ නුවරින් සමන් දෙව් රුවක්; සමනළ සිරිපා ගිර වෙතැ පෙරහැරින් දේවපති රාජයන්ගේ මූලිකත්වයෙන් වැඩම්ම කෙරිණි. සමන් දෙව් රුව සඳහා දේවාලයක් ඉදි කළ ඒ අගමැතිඳුන් විසින් සිරිපා පද්මය වසා මණ්ඩපයක් ද ඉදිකැරැවිණි.

## කිවි පුද

ඉහත ද සඳහන් කැරුණු, "සමන්තකූට වණ්ණනා", නම් පාලි කාව් පබඳ සිලෝ කාව් 796 ක් වුවද, එහි සිලෝ කව් 600 කින් පමණ බුදු සිරිත ද සෙසු කව් වලින් බුදුරදුන්ගේ ලංකාගමනය ද සිරිපා පිහිටුවීම (සමනළ ගිරේ) ද සිරිපා මහුල් ලකුණු ද විස්තර කැරේ. එම පාලි කව් පබඳ මෙන්මැ සිංහල සඳෙස් කව් පබඳවලත්, සමනළ සිරිපා අසිරිය, වැනුමට හෙළ කිවියෝ අමතක නොකළහ. "පූජාවලි, කතුවර මයූරපාද පිරුවන්පති, බුද්ධපුත්‍ර, මාහිමියන් සමනළ කුළ පිළිබඳ බැති දනවන අයුරින් - උවමිලකර ද යොදා ගත් අයුරු" ... ස්වාමි දරුවෝ පූර්ව දිග් බලා ලංකා නමැති අංගනාව, තමන් වහන්සේට පෙර මහ බලා කර නහා සිටියාක් වැනි වූ මුදුන් කුළු නමැති කේශ කලාපයකින් හා මීට පෙර දෙවාරයක් වැඩ, මට පාද ස්පර්ශය නුදුන් සේකැයි ශෝකයෙන් හඬවන කඳුළු ධාරා දෙකක් වැනි මහවැලි ගඟ හා කැලණි ගඟ වැනි ගංගා යුග්මයකින් හා තවද පාද වියෝගයෙන් ඛෙදව රත්නාභරණ සමූහයන් වනය සිසාරා සිටි සිය දහස් රත්නාකර සමූහයෙන් හා ශ්‍රීමත් වැ දිළිසෙන සමනළ කුළ දැකැ...." යන පිරිසිඳුමෙන් මොනවට පැහැදිලි යැ.

"සමනොළ මුදුනැ සිරිපද ඔබන මඟුලට
නිසසල මහ සෙනඟ ගෙන වඩින මුනිඳුට
පැහැදුළ දුතිල් මැණිකෙන් කළ මහ ලෙසට
මනදොළ පිරෙයි ගඟ සිරිසර දුට තොසට"

මේ හංස සංදේශ කිවියාණන් විසින් මැවුණු කව් සිතුවමේ කැලණි ගඟ සමනළ සිරිපා පිහිටුවන මඟුලට මහ සඟුන් පිරිවරා වඩින බුදු රදුන් උදෙසා ගිරි පාමුල සිට එහි මුදුන දක්වා එළන ලද මැණික්මය පියවිල්ලක, පාවඩයක සිරිසර පාතා බව කියැවේ. ගඟ දිය තිල් පැහැ යයි සලකා

දුනිල් මිණි අතුරා කළ මහක් ලෙස කිවියාණන් දැක ඇත.

"මුනි' ග මිණෙන්
සොබමන් සමන් ගිරි රද"

යැයි තිසර සඳෙස් කිවියාණෝ සමනොළ හෙළ, "ගිරි රාජයකු", කොට ගරු කරති. ඒ නිකම් මැ ගිරි රජෙකු නොවේ, මුනි සිරිපා අග මැණිකෙන් සොබමන් බවට පත් ගිරි රජ්දෙකි.

වැලිහිටියාවේ කැටකිරිලි සඳෙස් කිවියෝ, සමනොළ කුළ සතුටට පත්වූ සැටියක් දක්වති, මෙසේ.

වෙනින් කුළු නොලත් මුනි පදලස ලැබුණු
සමන් කුළ තුටුව නැඟු දදයක සිරිත

වෙනත් ගිරිකුළු නො ලැබූ වස්තුවක් බඳු මුනි සිරිපා සලකුණ සමනොළ ගිර ලැබ ආඩම්බරයට පත්වූ ලෙසින් සතුටු වී නැඟු කොඩියක් ලෙස මහවැලි ගඟ, එ කිවිතුමන් දුටු සැටියි.

## මෑත කිවි පද පුද

"බුදු සිරිපා ලස, පිළිබඳ සඳහන් නොවන, එහෙත් සමනොළ ගිර පිළිබඳ වැනුම් රැසකි. ඒ වැනුම් ඉවතැ ලා .. "සමන්ළත් සිරිපා සලකුණත්", දෙකමැ. වැනුමට ලක් වූ කවි පබැඳුම් පමණක් මෙහි යෙදුමට සිතා ගත් සේ සලකනු මැනවි. මෑත අවදියේ කිවියන් සමනළ සිරිපා සිරි වැනූ සැටිද බැලුව මනා යැ.

සමනොළ කුළෙහි තතු සමනොළ ලවා මැ කියැවෙන අයුරින් කැරුණු ගී - කවි පබදෙකි මේ.

බල මෙ විපුල ලො තුළැ-වතු එකමැ සෙට කුළයි

ගිරි නම්ති සුපතළ - එහි යැ වූයේ මගේ ඉපැදුම
අප කුල නැතොත් ලොවැ-දැඩි, තුඟු, තිරමේ ගුණ ලා
උවමට කිවින් මුව - ලබාදෝ වතක් කොතැනින්?
සමනොළ යැ යනු මා - නම ලො පළ මෙම ලක රැකි
සමනුන් තිවෙස වනු - මෙහි යැ නෙක දන ලබන පිදවිලි
මා හිසැ පන්සලෙකි - මහ සහරුවන වැජැඹෙන
සසුන උදෙසා මහ - බරක් මෙතරම් දරහි කවරෙක්?

යන මේ පබැඳුම දුබස වෙළුමේ 22 කලඹිති.

මෙලොවැ එකමැ ඉහළ ගිරි කුළ - කුළයේ වන දැඩි බව, තිරසර බව, උසස් බව පැමට කිවියන් විසින් ගනු ලබන කුළක් - පර්වතයක් වූ, නම ලොවෙහි මැ පසිඳු මෙ ලක්දිවට අරක් ගත් සමන් දෙව් තිවසත්, නොයෙක් දනන්ගේ වැඳුම් ලබන තැනත් සඟුන් වැඩවසන පන්සලත් නිසා බුදු සසුන වෙනුවෙන් මෙතරම් මහ බරක් කව්රු දරත් දැයි සමනොළ ගිර අසන ලෙසිනි, මේ ලියැවී ඇත්තේ.

මේ ගී පබඳත් විමසනු සුදුසු තරම්.

සිරිපා සලකුණෙන් - සිරස සරසා ගෙන
අවටැ කඳු කුදු කොටැ - ඔවුන් වනත හිසින්
යුතු වැ වට පිරිවර - මැද රත් මෙර සිරින්
මුළු තුන් හෙළය හා - අවටැ සමුදුරැ හා
මෙ මුළු ලොව හා - පල වැ ප්‍රබල වැ දිලෙයි
සමනොළ හෙළ...
හෙළ කුළ තිවෙස කැරැ - වෙසෙමින් මුදුනකු වී
බුදුනුදු මුදුනැ කැඳවා - සිය ගෙය තිවෙස කැරැ
සමනොළය යන නමට - අනුරුත් දී දෙව් ලෝ සිටි
සුමන හෙළ මුත්තා - දිනකැ හිමිදිරියේ
සිරිපද වැඳ පුදනු වස් - සහපිරිවරින් ආයේ.......

( රත් මිණි වළලු )

මේ පූවදුරු කථිකාචාර්ය - ධර්ම ශ්‍රී ගුණපාල සුරින්ගේ ගී - කව් පොතෙහි, "හිම මහිම", මැයෙන් වූ කව් සිතිවිල්ලකි. මෙයිනුදු බැතිමත් හද කුළුගැන්වේ.

මෙකලැ සමහර චන්දනාකරුවන්ට ද උපහාසයක් එල්ල කැරෙනා තවත් ගී - කවි පබඳෙකින් ගත් කොටසෙකි මේ.

සුරඟනන් සමඟින්, සමන් සුරිඳුන් පුද දුන්
පරසතු - මදාරා පුද, එ දවසැ එසේ ලදුයෙමි
පෙර බැතිමත් හඬින්, වන ගැබත් ගුම් ගැන්විණි
මෙකලැ කැම් ගී ගැයුමන්, ඇසෙත මහඳ රුදා දෙයි
බුදුන් සිරිපා පහසින් හේළි වූ මා හිසැ
පවිටු නොදනත් පහසින්, කැලි වනු කෙසේ ඉවසම්?"

එඩිය 5 වෙළුමේ, 5 කලමෙහි එන මේ ගි කවි කැඩිය ද සමනොළ ගිර ලවා, එදා බුදු සිරිපා පහසින් පිරිසිදු වූ තම හිස අද පවිටුවන්ගේ පහසින් අපිරිසිදු වන හැටි කෙසේ ඉවසම් දැයි කියවෙන ලෙස ලියැවුණකි.

ලක්දිව පමණක් නොවැ මුළු ලොවමැ සුපතළ සිරිපා සමනළ ගිර සබරගමු පෙදෙසට මුර දෙවියකු බඳුව දිසෙයි. මෙහි අසිරිය නම්, මුනි සිරිපා ලත් සිහිලස මුළු ලක්දිව දෙරණ පුරා පතුරන්නා සේ කැලණි - කළු - වලවේ - මහවැලි සිව් ගංගා සමනළ ගිරි හිස ඉසව්වෙන් ගලා බැසිමයි. මේ අසිරිය එදා මෙදා කිවියෝ නන් සැටියෙන් වැනූහ. ඒ හැම වැනුමක් මැ බුදු සිරිපා සලකුණ මුල් කොට ගෙන ඇති සැටි දැක්ක හැකිය.